# ප්‍රමුඛතා මූලික සත්කාර මධ්‍යස්ථාන

## ඔබට කඩිනමින් වෛද්‍යවරයකු හමුවීමට අවශ්‍යද?

හදිසි තුවාල හෝ අසනීප තත්ත්වයන් ඇති ඕනෑම කෙනෙකු සඳහා ප්‍රමුඛතා මූලික සත්කාර මධ්‍යස්ථාන (PPCCs) මගින් නොමිලේ ප්‍රතිකාර සැපයේ.

රෝහලේ හදිසි අනතුරු අංශයට වඩා කඩිනමින් ඔබට අවශ්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට PPCCහි වෛද්‍යවරු ඔබට උපකාර කරනු ඇත.

සුළු ආසාදන, සුළු පිළිස්සීම්, උළුක්කු හෝ අස්ථි බිඳීම් බවට සැකකෙරෙන අවස්ථාවන් සඳහා ඔවුන්ට ප්‍රතිකාර කළ හැකිය. ඔවුන්ගේ සේවාවලට ව්‍යාධිවේදය, විකිරණවේදය හා ඖෂධ ඇතුළත් වේ.

**ඔබට දරුණු තුවාලයක් හෝ අසනීපයක් ඇත්නම් බිංදු තුන (000) අමතන්න. ඔබට කඩිනම් ප්‍රතිකාර අවශ්‍ය නැත්නම් ඔබේ සාමාන්‍ය වෛද්‍යවරයා සමග හමුවීමක් යොදා ගන්න.**

PPCC සේවා මෙඩිකෙයා කාඩ්පතක් ඇති නැති ඕනෑම අයෙකුට නොමිලේ සැපයේ.

PPCC හි භාෂණ පරිවර්තකයෝ සිටිති. 131 450 ඔස්සේ පරිවර්තන හා භාෂණ පරිවර්තන සේවාව TIS අමතන්න.

**ස්ථාන හා වැඩිදුර තොරතුරු සඳහා Better Health Channel වෙත යන්න:**
betterhealth.vic.gov.au/priority-primary-care-centres

TIS TRANSLATING AND INTERPRETING SERVICE

phn VICTORIAN-TASMANIAN ALLIANCE
An Australian Government Initiative

VICTORIA State Government